හොරණ ශ්‍රී පාලි මණ්ඩපය ජනසන්නිවේදනයද මාධ්‍ය සන්නිවේදනයද ?

මෙම ලිපිය ජනසන්නිවේදන (Mass Communication) විෂයට වඩා මාධ්‍ය සන්නිවේදනය (Media Communication) යන සංකල්පය දෙසට නැඹුරු වන්නේ හොරණ ශ්‍රී පාලි විශ්වවිද්‍යාල මණ්ඩපයෙහි විෂය ධාරාව "මාධ්‍ය " (Media) යන සංකල්පය තුළ අනන්‍යතාව ගොඩ නංවන බැවිනි. මෙය ජාතික, ආර්ථික, සහ සමාජ සංවර්ධනයට පමණක් නොව වෘත්තීය විෂයටද අනුරූප වන ලෙසින් හැඩ ගසා ගත් ජාතික විශ්වවිද්‍යාල පද්ධතියෙහි ප්‍රමුඛතම පාඨමාලාවක් ලෙසින් ක්‍රියාත්මක වේ.

ඒ අනුව හොරණ ශ්‍රී පාලි විශ්වවිද්‍යාල මණ්ඩපය තවත් ජනසන්නිවේදන අධ්‍යයනාංශයක් ලෙස නොව මාධ්‍ය සන්නිවේදන අංශයක් ලෙස හඳුනා ගැනීම වැදගත් බව අවධාරණය කරනු කැමැත්තෙමි. මෙම ඉහත සඳහන් විෂය ධාරා දෙකෙහි සුවිශේෂිතා හඳුනා ගැනීම වැදගත් වේ. Mass යන සංකල්පයෙහි අරුත . ජන' ලෙස සිංහල භාෂාවට පරිවර්තනය කොට ඇතත් එය සමස්ත සැබෑ සමාජ සහ සන්නිවේදන ක්‍රියාවලිය හා බද්ධ නොවන බැව් ශ්‍රී පාලි මණ්ඩපයේ මණ්ඩපාධිපති ආචාර්ය ටියුඩර් විජසිංහයන්ගේ අදහසයි.

සමාජ සබඳතාවන්ගේ සංකීර්ණ නිර්මිතය ප්‍රමාණාත්මක ලෙස සහ ගුණාත්මකව වර්ධනය කළ හැකි "සංහතික " යන වචනය "Mass" යන්නට දිය හැකි, නිශ්චිතව එහි ගවේෂණාත්මක සන්දර්භය සහ ප්‍රවණතා අනාවරණය කර ගත හැකි නිවැරදි සිංහල තාක්ෂණික අරුත ලෙස ඔහු යෝජනා කරයි. ඒ අනුව සංහතික සන්නිවේදන ක්‍රියාවලියකටත් වඩා සංකීර්ණ මාධ්‍ය ක්‍රියාවලියක් පිළිබඳ විචාරය කිරීමට කාලය විවර වී ඇති බැව් පැහැදිලිය. නව ලෝකය තුළ සංකීර්ණ සමාජ ක්‍රියාවලීන් නිර්මාණය කරන "මාධ්‍ය" අධිපති අභිමතාර්ථ තුළ මානව ග්‍රහණකරණයේ නිර්ණාත්මක සාධකය බවට පත්ව තිබේ.

පසුගිය දශක දෙක තුළ සන්නිවේදනයේ බල කේන්ද්‍රීය ආයතන ලෙස පරිගතකය සහ තොරතුරු තාක්ෂණය අතර ගොඩ නැගෙන ඓන්දීය සබඳතාව දෘෂ්ටිමය චින්තනාවන් පමණක් නොව භෞතිකමය සීමාවන් ද නියාමනය කරමින් මානව ප්‍රජානනයේ සියලු සීමා අතික්‍රමණය සඳහා සියලු ශක්තීන් කේන්ද්‍රීය කොට ගෙන ඇති. බැව් පෙනේ. මාධ්‍ය සන්නිවේදනය යන අන්තර් සම්බන්ධිත විචලනයන් විවිධ ප්‍රවණතා ඔස්සේ ප්‍රාග්ධන ආයෝජන කේෂ්ත්‍රයක් වශයෙන් ද පොදු ජන සමාජය තුළ ව්‍යාප්ත වෙමින් ස්වාධීන පැවැත්මක නැඹුරුව තහවුරු කරගනිමින් සිටී. මෙම සමාජ, දේශපාලනික, ආර්ථික, ප්‍රපංචයේ ප්‍රචාරණවාදයේ බලපෑම ජන සන්නිවේදන ක්‍රියාවලියෙන් ඔබ්බට ගොස් එහි නිශ්චිත ස්වරූප සහ ව්‍යුහයන් ගොඩනගා ගනිමින් සිටී.

වර්තමානයේ මාධ්‍ය යනු සමාජයේ අභිමතාර්ථ සහ වටිනාකම් තුළ ව්‍යුහගත වූ ප්‍රබලතම සමාජීයය ආයතනයක් ලෙස සැලකිය හැකිය. එය මානව සමාජ ක්‍රියාවලියෙහි කුමන ප්‍රමාණයෙහි හෝ බලපෑම් සහ ස්වභාවයන් වුව වෙනස් කිරීමට හැකි ප්‍රබල ගති ලක්ෂණ වලින් යුතු වේ. අන්තර්ජාලය පදනම්ව ගොඩ නැගෙන නව මාධ්‍ය (New Media) ක්‍රියාවලිය ජන සන්නිවේදනයෙහි පදනම් දෙදරවීමට තරම් සුවිශේෂී හැකියා වර්ධනය කරගෙන ඇති බැව් පැහැදිලිය.

අතීතයෙහි මාධ්‍ය ආයතන (Media Companies) පොදුජන ග්‍රාහකත්වය සඳහා කළ යුත්තේ කුමක් ද (do to) යන්න පිළිබඳ නිර්වචනය කරන විට එය වර්තමානයෙහි පොදු ජන සහවාසය සමගින් හද අසළය" කළ යුත්තේ කුමක් ද යන්න දක්වා ඓන්දීයමය වෙනසක් ස්වකීය ක්‍රියා ස්වරූපය තුළ ගොඩනගා ගෙන තිබේ. මාධ්‍ය සමගින් ගොඩ නැගෙන සමාජ විඥානයෙහි ස්වරූප සහ ක්‍රියාකාරීත්වයන් ප්‍රායෝගික භාවිතයන් තුළ ගොඩනැගෙන සමාජ උරුමයක් බවට පත්ව තිබේ.

ඒ අනුව සමකාලීන ජාතික හා ලෝක ක්‍රියාකාරීත්වයේ ගති ලක්ෂණ නිර්මාණය කිරීම කෙරෙහි තීරණාත්මක බලපෑමක් මෙම බල අධිකාරී මාධ්‍ය ආයතන භාවිතයන් තුළට කේන්ද්‍ර වී ඇත. ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණ සහ නව්කරණ ක්‍රියා දේශපාලන බල අධිකාරියේ මූලිකත්වයෙන් ප්‍රජානනය කරන මාධ්‍ය අවගාහනා සහ එයට එරෙහි සමාජ වගකීම් සංකල්ප ආධිපත්‍ය කොට ගත් මාධ්‍ය ද මානව ඉරණමේ කොටස්කරුවන් ලෙස ජනතාවාදී ප්‍රවාහයට කේන්ද්‍රීය වේ. මෙම මාධ්‍ය බල ව්‍යුහයන් සමස්ත සමාජ ක්‍රියාවලිය (Social Process) අසීමාන්තිකව මෙහෙයවීම ස්වකීය කාර්යභාරය කොට ගෙන ඇත. ඒ සඳහා චන්ද්‍රිකා තාක්ෂණය (Satellite Dishes) සහ අන්තර්ජාලය ඩිජිටල් ක්‍රමවේදීය භාවිතයන් තුළ මානව සංවේදීතාවන්හි අරමුණු වෙනස් කොට තිබේ. ගෘහ සමාජ අන්තර් ක්‍රියාවලිය සහ චින්තනයේ ස්වරූප ගෘහ මාධ්‍ය (Home Media) හැඩ ගැසීම තුළ වෙනස් වී තිබේ. ඒ අනුව නව දුරවත් Mas

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
ධර්මකීර්ති ශ්‍රී රංජන්
ජනමාධ්‍ය අධ්‍යයන අංශය
ශ්‍රී පාලි මණ්ඩපය
කොළඹ විශ්වවිද්‍යාලය

Communication යන්නෙහි Mass යන වචනයට Media යන වචනයෙහි උපයෝගීතාව පැහැදිලිය.

එහි වගකීම් වටහාගත් හොරණ ශ්‍රී පාලි විශ්වවිද්‍යාල මණ්ඩපයෙහි ජනමාධ්‍ය අධ්‍යනාංශය මතවාදී, සහ විචාරීය ප්‍රවේශයන් තුළ මාධ්‍ය පිළිබඳ විෂයයන් (Mediology) අනු කොටස් බවට පත් කොටගෙන තිබේ. එය සංකීර්ණ ලෝකයක දෘෂ්ටිමය සහ නායිකක දක්මක් බැව් පැහැදිලි කර ගත යුතුව තිබේ.

දශකයකට අධික කාලයක් තුළ ගොඩනැංවූ මෙම මාධ්‍ය ක්‍රියාවලිය පිළිබඳව මතවාදී විශ්ලේෂණ ඉදිරි කාල පරිච්ඡේදයෙහි තව ද නව ප්‍රවේශයනට අනුගත වෙමින් ඉදිරියට යාමට අවශ්‍ය ශක්තීන් මේ තුළ ගොනුවෙන ආකාරය දකිය හැකිය. ජාතික සහ සමාජ අවගතතා කේන්ද්‍රීයව ශිල්පාත්මක ලෙස ගොඩනැගුනු ජනමාධ්‍ය පාඨමාලාව බහුවිෂයීය ක්‍රමවේද හා න්‍යායන් තුළ නිරැකිතීන් සම්පාදනය කරමින් පර්යේෂණ දිශානතිය තුළ උප විෂය රාශියකට අනුගතව ප්‍රායෝගික භාවිතය තුළ ශික්ෂණය වූ සමාජ උරුමයකි. ශ්‍රී පාලි විශ්වවිද්‍යාල මණ්ඩපයෙහි නූතන සහ පශ්චාත් නූතන සම්ප්‍රදායන් හා මතවාද ඉදුරුකොට යන් මෙම නව සමාජ උරුමය රෝ දමීමට කලයුතු කිරීම ජාතිකමය වශයෙන් ගොඩ නැගෙන ප්‍රබලතම අපරාධයකි.

මෙම මාධ්‍ය හැසිරීම්, තොරතුරු ක්‍රියාවන් සහ එහි ප්‍රතිඵල දෙස වෙනස්වන සමාජ සහ චින්තනමය ස්වරූප පිළිබඳ ඒක විෂයීය ස්වරූපයකින් අධ්‍යයනය කළ හැකි ද යනු ප්‍රශ්නයකි. මෙම මානව සමාජ ක්‍රියාවලිය සබුද්ධික ලෙස හේරුම් ගැනීම සහ පර්යේෂණ කිරීම සඳහා සමාජ විද්‍යාව, මානව විද්‍යාව, මනෝ විද්‍යාව, ආර්ථික විද්‍යාව, දේශපාලන විද්‍යාව සහ ඉන්ජිනේරු තාක්ෂණය දර්ශනය වැනි විෂය විශ්ලේෂණාත්මක චින්තනය එහි පරම විද්‍යාත්මක ස්වරූපය පෙන්වා දෙයි.

ගණිතය සහ භෞතික විද්‍යාව තොරතුරුවේදයේ න්‍යායික සහ සංකල්පීය වර්ධනය සඳහා අති විශාල දායකත්වයක් දරයි. තොරතුරු සම්ප්‍රේෂණ හැකියාව හා සංඥා වන්ගේ ගුණාත්මක භාවය පිළිබඳ ගැටලුව ඔවුන්ගේ පරීක්ෂාවට භාජනය වන්නකි.

ඒ අනුව තැන් තැන්වලින් අනුලාභත් විෂය කොටස් නොව මෙම මාධ්‍ය ක්‍රියාවලිය නිවැරදිව තේරුම් ගැනීම සඳහා නව මාධ්‍ය විශ්ලේෂණාත්මක චින්තනයක් ගොඩනැංවීමට අවශ්‍ය සියලු විෂයන්ගේ ඒකාබද්ධතාව සොයා යැමකි. එය අප විෂයානු බද්ධ ලෙස හඳුන්වන්නේ සාකල්‍යමය ප්‍රවේශය යනුවෙනි. මානව සමාජය පිළිබඳ ගැඹුරු විශ්ලේෂණාත්මක චින්තනයකින් බැහැරව මාධ්‍ය සංකල්පයට පැවතිය හැකිද යනු ප්‍රශ්නයකි. මාධ්‍ය පිළිබඳ සියලු පදනම් සැකසෙන්නේ අනෙකුත් සමාජීය හා භෞතික විද්‍යාවන් මත බව උසස් අධ්‍යාපන අමාත්‍යාංශය පැහැදිලි කරගත යුතුව ඇත.

දේශපාලන න්‍යායයින් අධ්‍යාපනය පිළිබඳ පමණක් නොව අනෙකුත් සමාජ සංවර්ධන ධාවක බලවේග පිළිබඳ තීරණ ගැනීමේ ක්‍රමවේදී ගැටලුව පොදු ජන ක්‍රියාවලිය තුළ ප්‍රායෝගිකව විවේචනයට ලක්වන්නකි. වර්තමානයේ අධ්‍යාපනඥයන්ගේ කාර්යභාරය කෘෂි විද්‍යාඥයන්ගේ කාර්යභාරය ආදිය දේශපාලනඥයන්ගේ කාර්යභාරයන් බවට පරිවර්තනය කොට ගෙන ඇත්තේ ඒ පිළිබඳ විශේෂඥයින්ගේ තත්වය අමතක කරමිනි. මෙම වර්තමානයේ එකිනෙකට නොපැහෙන කොටස් හසිඹිඩ් කිරීමට යැමෙන් හිතකර ප්‍රතිඵල වලට වඩා අහිතකර ඉතා භයානක ප්‍රතිඵල නිර්මාණය වනු ඇත. මෙම අහිතකර ප්‍රතිඵලයන්හි සැබෑ උරුමක්කාරයින් වන්නේ දේශපාලනඥයන් නොව මහා සමාජයයි.